මාර්ගගත දැන්වීම

# ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම

## පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2025/2026

**ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.**

| | | |
|---|---|---|
| පාඨමාලාවේ කාලය | : | මාස 12 යි. (සති අන්ත) |
| පාඨමාලාවේ ස්වභාවය | : | සෙමෙස්තර ( Semester) 02 කින් මාර්ගගත ක්‍රමයට පාඨමාලාව පැවැත්වේ. |
| පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | : | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක. |
| පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය | : | සිංහල/දෙමළ |
| පාඨමාලා ගාස්තුව | : | රුඃ 50,000/= කි. (සමාන වාරික 02 කින් ගෙවිය හැකිය).<br>අයදුම්පත් ගාස්තුව රු. 1,500/= , ලියාපදිංචි ගාස්තුව රු. 1,000/= |

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

ඉල්ලුම්පත් කැඳවීමේ අවසන් දිනට පහත සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

1. අවම වෘත්තීය සුදුසුකම් වශයෙන් පුහුණු ගුරු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සමඟ

2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / විදුහල්පති සේවයේ /ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරියකු වීම හෝ වැඩ බලන විදුහල්පති තනතුර දරන නිලධාරියකු වීම හෝ රජයේ හෝ අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙක් වීම.

   සහ

3. අවම වශයෙන් අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් හා ඉන් අවම වශයෙන් එක් අවුරුද්දක පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද තිබීම ( පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද සහ සේවා වාර්තාව සම්මුඛ පරීක්ෂණයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් ලබාගත් ලිපියක් මගින් තහවුරු කළ යුතුයි)

4. තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේ දී (2025/2026) ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් අධ්‍යාපන ආයතනයක හෝ කිසිදු පාඨමාලාවක් හදාරමින් නොසිටීම.

**පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

1. සියලුම අයදුම්කරුවන් වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් මාර්ගගත ක්‍රමයට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු පිළිවෙළ**

1.0 අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ආකාරය

**exams.nie.lk/intakes/new** වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. (Sign up) සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබාගත හැක **exams.nie.lk/info/register-as-a-user** පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

2.0 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Log in)

2.1 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව (User Profile) යාවත්කාලීන (Update) කරන්න.

- පෞද්ගලික තොරතුරු
- සේවා තොරතුරු
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

2.2 **exams.nie.lk/new intake** Diploma in School Management පාඨමාලාවට තෝරා ගන්න.

2.3 My application තෝරා තොරතුරු නිවැරදිව ඇතුලත් කර එය නැවත පරීක්ෂාකර අයදුම්පත්‍රය යොමු කරන්න. (අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබාගත හැක. **exams.nie.lk/info/applying-for-new-enrollments**

2.4 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය (Application Reference Number) සටහන් කර තබා ගන්න.

3.0 **අයදුම්පත බාගත කිරීම (Download Application)**

මාර්ගගත (Online) අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබගේ යොමු අංකය (Reference Number) සමඟ ලැබෙන විස්තර ඇතුළත් පිටපත මුද්‍රණය කර එය ආයතනික ප්‍රධානියා මගින් සහතික කරවා ගෙන, මුදල් ගෙවන ලද රිසිට් පතෙහි මුල් පිටපත සහ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව, **අධ්‍යක්ෂ, වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

1 පුහුණු ගුරු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය
2 පත්වීමේ ලිපිය (පාඨමාලාවට අදාල)
3 සේවා සහතිකය

ඔබගේ ලේඛන බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ “DSM 2025/2026 Sinhala” යනුවෙන් සඳහන් කළ යුතු ය.

4.0 වැඩිදුර විස්තර සඳහා සිංහල මාධ්‍යය පාඨමාලා සමායෝජක M.M.K.J මණතුංග මිය 077 8425488/0117601307 දෙමළ මාධ්‍යය පාඨමාලා සමායෝජක T. රවිචන්ද්‍රන් මයා 0779697879/0117601315 තාක්‍ෂණික සහාය සඳහා මාධව තෙන්නකෝන් මයා 0117601777 / 0117601776 දුරකථන අංකවලට සතියේ දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 4.00** දක්වා අමතන්න.

**අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනය 2025.11.15**

සැ.යු - අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය කිසිදු හේතුවක් නිසා නැවත දීර්ඝ නොකරන බව කාරුණිකව දන්වමි.

මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD)
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.